## සංකල්පනා

පුරා සැත්තෑ දෙවසරක්
මා හා
දිවෙන් දිව ගාගෙන
එකිනෙකාගේ
රළුබව-මුදුබව
මට කියා දුන්
ඔබ හැමදෙන
උන් හිටි ගමන්
එකිනෙකා
මා අතැ'ර ගියේ
දිනෙන් දිනම
මා හුදකලා කරමිනි
ඔබ සැම හා එක්ව
එද
මා නැගු හසරල්
මඳ සිනා
දුටු-දුටුවන්
මන්මත් කළ අයුරු
තුරුණු වියේ
මැවූ රූ සිරි
දැනුදු හැගේ මට
එද මෙන් අදත්
එහෙත් සබඳ
දිවිමගේ සැදෑ සමයට
ළඟාවන මාහට
සඳලු තලයේ
මිණි කිකිණි රැව්දුන්
කෙළි ලොල් නද
ඇතින් ඇතට හඬායද්දී
ම'හද සොම්නසින්
පිබිදවූයේ
පහත මාලයේ
මා අසලම රැඳීසිටි
ඔබ පමණි
අද
ඔබ මා අතැ'ර යන්නට
නොහැකිව
අසරණවූ වග
මම දැනගතිමි
එහෙත් මිතුර,
අනිත්‍යවූ දිවිමගේ
නිත්‍යවූ කිසිවක් නැත.
ඉවත ලන දැහැටි කූරක්
මෙන්
බිම දිගාවූ ඔබගේ
කෙඳිරිලි හඬ
යාන්තමට ඇසී-නැසී ගියද
ඔබ අතැ'ර දමා
හුදකලා නර
කෙසේ නම්
පිය මනින්නද
මා පාමුල වැතිර
සිටි ඔබ
සැණෙන් සුරතට
පත්වූයේ
දිවි ඇතිතෙක්
මහරු සම්පතක් සේ
ඔබ
සුරකින බවට
අදිටන් කරමිනි.
ඔබ මට මෙතෙක්
කළ සේවයට
පිදු උපහාරයයි එය
ඔබ කවුද?
දිවි මගේ මෙතෙක්
කල් මා සුරැකී
අද මට අහිමි වූ
අවසාන දත්ත කල්‍යානියයි.

කල්‍යානි සෙනරත් යාපා
හිඹුටාන 2013 සැප් 13